සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
சபரகமுவ மாகாண கல்வித் திணைக்களம்
Sabaragamuwa Provincial Department of Education

**දෙවන වාර පරීක්ෂණය 2018** | **11 ශ්‍රේණිය**
**இரண்டாம் தவணைப் பரீட்சை 2018** | **தரம் 11**
**Second Term Test 2018** | **Grade 11**

**නර්තනය (දේශීය) II**
**Dancing II**

**පැය දෙකයි**
***Two hours***

- **පළමුවැනි ප්‍රශ්නය අනිවාර්ය වේ.**
- **පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

---

01. සියලුම ප්‍රශ්නවලට සුදුසු පිළිතුරු ඔබගේ පිළිතුරු පත්‍රයේ අදාල ප්‍රශ්න අංකය යොදා ඉදිරියෙන් ලියන්න.

(i) සිංහල ජන නැටුමේ එන ලී මල්ලිය, දෙමළ ජන නැටුමේ දී ............................................ ලෙස හඳුන්වයි.

(ii) අ.පො.ස. (සා.පෙළ.) විෂය මාලාවට නැටුම් විෂය එක් වූයේ .............................................. වර්ෂයේ දීය.

(iii) " මණ්නඩි රාළ " ............................................ මුද්‍රා නාට්‍යයේ එන චරිතයකි.

(iv) ප්‍රථමයෙන් උඩරට වන්නම් ගායනා කරන ලද්දේ ............................................................. මඩුවේ දීය.

(v) " මිනික්කු " හා " පච්ඡා " යනු .............................. නර්තනයේ වේෂ නිරූපන ක්‍රම දෙකකි.

(vi) රේඛා හැඩතල හා සමබරතාව යන මූලධර්ම නර්තන කලාවට මෙන්ම ............................ කලාවට ද වැදගත් වේ.

(vii) අස්නය සහ යක් ඇනුම යනු ශාස්ත්‍රීය නර්තන අංග ............................ නර්තන සම්ප්‍රදායට අයත් වේ.

(viii) කථකලි නර්තනයේ ප්‍රධාන ගායකයා පොන්නානි වන අතර අනු ගායකයා ........................... නමින් හැඳින්වේ.

(ix) සතර අභිනයේ දී වේදිකා සැරසිළි .......................... නමින් ද ගී ගායනා ................. නමින් ද හැඳින්වේ.

(x) පහත දැක්වෙන නාට්‍යමය අවස්ථා ඇතුළත් ශාන්තිකර්ම දෙක නම් කරන්න.

අ. යක්කම් පහ ............................................................

ආ පොත්කඩේ පාලිය ............................................................ (ලකුණු - 12)

(02) (i) තුන් තිතේ තාල රූපයට අයත් කවියක් ප්‍රස්තාර කරන්න.

(ii) මුසලඩි වන්නමේ අඩව්ව ප්‍රස්තාර කරන්න.

(iii) "තකට" යන බෙර පදය විලම්භ, මධ්‍ය, දෘත යන ලය ප්‍රභේදයන්ට අනුව ප්‍රස්තාර කරන්න. (ලකුණු - 4 X 3 )

(03) පහත සඳහන් මාතෘකා අතුරින් 3 ක් පිළිබඳ කෙටියෙන් හඳුන්වන්න.

(i) සරල අංග රචනය.

(ii) වන්නම් වල පසුබිම හා විකාශනය.

(iii) කථකලි නර්තනයේ වේෂ නිරූපණය.

(iv) ග්‍රහ පන්ති කවි.

(v) වාද්‍ය භාණ්ඩ වාදන අවස්ථා වලින් හෙලිවෙන විවිධ මනෝභාවයන්. (ලකුණු - 4 X 3 = )

(04) (i) කොහොඹාකංකාරී ශාන්තිකර්මය පැවැත් වූ අතීත අරමුණෙන් සමාජයට දෙන ආදර්ශ මොනවාදැයි පැහැදිලි කරන්න.

(ii) දෙවොල් මඩුවේ හා පහන් මඩුවේ දක්නට ලැබෙන සමානතා හා අසමානතා දෙක බැගින් ගෙන විසිතර කරන්න.

(iii) ඔබ කැමති ශාන්තිකර්මයට නාට්‍යමය අවස්ථාවක් විග්‍රහ කරන්න. (ලකුණු - 04 X 3 )

(05) (i) සොකරි හා කෝලම් නාටකවල එන කාන්තා චරිත දෙක බැගින් නම්කරන්න.

(ii) ශ්‍රී ලංකාවේ ගැමි නාටක පැවැත්වීමේ වර්තමාන අරමුණු පැහැදිලි කරන්න.

(iii) කෝලම් නාටකයේ රංග භූමිය පිළිබඳ විස්තර කරන්න. (ලකුණු - 04 X 3 )

(06)



A



B



C

(i) A රූපයෙන් දැක්වෙන රංග කලාවේ ආරම්භය හා විකාශනය පිළිබඳ විමසීමක් කරන්න.

(ii) B රූපයෙන් දැක්වෙන නාටකයෙහි දක්නට ලැබෙන සරල බව පිළිබඳ ඔබේ අදහස් දක්වන්න.

(iii) C රූපයෙන් දැක්වෙන නර්තන සම්ප්‍රදාය බිහිවීම පිළිබඳ ඔබේ අදහස් දක්වන්න. (ලකුණු - 04 X 3 )

(07) (i) මානසික ස්වස්ථතාව කෙරෙහි බලපාන පාරිසරික සාධක දෙක නම් කරන්න.

(ii) නර්තන ක්‍රියාකාරකම් තුලින් දරුවෙකු වර්ධනය කරගන්නා හැකියා මොනවාදැයි පැහැදිලි කරන්න

(iii) ඉහත හැකියා සමාජ යහපැවැත්ම සඳහා හේතුවන ආකාරය විග්‍රහ කරන්න. (ලකුණු - 04 X 3 )